# Abstract No 63

## ලෞකිකත්වය ලෝකෝත්තරත්වය හා ජ්‍යොතිෂය

**පූජ්‍ය. අඹලියද්දේ නන්ද හිමි**
ambaliyaddenanda@gmail.com

ජ්‍යොතිෂය යනු ගුප්ත විද්‍යාවක් නොවේ. එය ප්‍රායෝගික විද්‍යාවකි. එය කිසිම ආගමකට ධර්මයකට නෑකම් කියන්නක් නොවේ. එය හුදෙක් ම සවභාව ධර්මයේ ක්‍රියාකාරකමක් පමණි. එහෙත් බුදුරජාණන් වහන්සේ නිවන් දැකීමට උත්සාහ කරන්නෙකු විසින් නොසෙවිය යුතු ශාස්ත්‍රයක් ලෙස ජ්‍යොතිෂ ශාස්ත්‍රය හඳුන්වා ඇත්තේ එය නිවනට යන මාර්ගය කියා දෙන ධර්මයක් නොවන නිසා ය. බුදුවරු කිසිකලකත් චතුරාර්ය සත්‍යයට පිටින් ධර්මය දේශනා නොකරති. ජ්‍යොතිෂ ශාස්ත්‍රය චතුරාර්ය සත්‍යය මෙන් සනාතන වූවක් නොවේ. ජ්‍යොතිෂය සනාතන ධර්මයක් වූවා නම් චතුරාර්ය සත්‍යය ද එයට එකතු කොට පඤ්චසත්‍යයක් ලෙසින් දේශනා කරන්නට ඉඩ තිබිණ. එය එසේ නොකරන ලද්දේ බුදු ඇසින් දකින සත්‍යතාව එහි නොමැති බැවිනි. ජ්‍යොතිෂ ශාස්ත්‍රය සකසාගෙන ඇත්තේ ලෞකික ඍෂිවරුන් විසින් සාමාන්‍ය මිනිසාගේ ජීවිතය සැපවත් කරන ශාස්ත්‍රයක් ලෙස ය. ජ්‍යොතිෂය යනු මානව වර්ගයාගේ එදිනෙදා ජීවිතයේ දී ඉදිරිපත් වන අනේකවිධ දුක්කරදර බාධා ඉවත්කර යහපත හා සැපත සඳහා ඉර, හඳ ආදි වූ සෞරග්‍රහ මණ්ඩලයේ රවි, සඳු , කුජ ආදි ග්‍රහ තරු ද මේෂ, වෘෂභ ආදි රාශි තරු ද අස්විද ආදි නැකැත් තරු ද උපයෝගී කරගෙන උගන්වා ඇති ලෞකික ශාස්ත්‍රයකි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් පහළ වන්නේ කෙලෙස්වලින් බර ව නැවත සසර ඉපිද දුක් විඳින ලෞකික සත්ත්වයා නිවන් මග කරා යොමුකර වීමට යි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ ඉන් පරිබාහිර වූ ශාස්ත්‍රයක් හෝ ධර්මයක් ලෝකසත්ත්වයාට දේශනා කොට නැත. ඒ අනුව පෙනෙනුයේ ලෝකෝත්තර දහමක් උගන්වන බුද්ධ ධර්මයත්, ලෞකික ශාස්ත්‍රයක් වන ජ්‍යොතිෂ ශාස්ත්‍රයත් එකිනෙකට වෙනස් අරමුණු දරන බව යි. මෙම කාරණා මූලාශ්‍රය මගින් සනාථ කර ගැනීම මෙම පත්‍රිකාවේ අරමුණ වේ.

ප්‍රමුඛපද-ඍෂිවරු, ජ්‍යොතිෂය, බුදුරජාණන් වහන්සේ, ලෝකෝත්තරත්වය, ලෞකිකත්වය